# ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍ය ශාලාව සඳහා ශ්‍රී ජයර්ධනපුර මහාරෝග්‍ය ශාලාවට අනුයුක්තව කොළඹ හෝ කඳාන හෙද විදුහලට හෙද ශිෂ්‍යාවන් බඳවා ගැනීම

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවට අනුයුක්තව කොළඹ හෝ කඳාන හෙද විදුහල් වල පුහුණුව ලැබීම සඳහා බඳවා ගැනීමට පහත දක්වෙන සුදුසුකම් සපුරාලන ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අ) අධ්‍යාපන සුදුසුකම් :**

(i) අ.පො. ස. (උසස් පෙළ) විභාගයේදී විද්‍යා විෂය ධාරාවට අයත්, ජීව විද්‍යාව / ගණිතය / කෘෂි විද්‍යාව විෂය ධාරාවෙන් සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්වීම, පැරණි විෂයය නිර්දේශය යටතේ විෂයන් 03 කින් එකවර සත්වීම.

(ii) සිංහල / දෙමළ භාෂාව, ගණිතය විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයන් 04 ට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

**ආ)** 1. 2023.06.02 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 25 ට නොවැඩි විය යුතුය.

2. උස අඩි 5' ට නොඅඩු විය යුතුය.
3. අවිවාහක විය යුතුය.
4. ශාරීරිකව හා මානසිකව නිරෝගී විය යුතුය.
5. පුහුණුව සාර්ථකව නිමකරන තුරු අවිවාහකව සිටීමට එකඟ විය යුතුය.
6. කාන්තා අයදුම්කරුවන් පමණක් අයදුම් කළ යුතුය.

**ඇ)** තෝරා ගනු ලබන අයදුම්කරුවන් කොළඹ හෙද විද්‍යාලයේ වසර තුනක (03) කාල සීමාවක පුහුණුව ලැබියයුතු අතර, අභ්‍යාස කාල සීමාව තුළ පහත සඳහන් ගෙවීම් ලබා දෙනු ඇත.

| | | |
|---|---|---|
| පළමු වසර | : | මසකට රු. 27,140/- |
| දෙවන වසර | : | මසකට රු. 27,440/- |
| තෙවන වසර | : | මසකට රු. 27,740/- |

ඉහත ගෙවීම් වලට අමතරව ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල් මණ්ඩලය මගින් අනුමත කරනු ලබන දීමනාද ලබා දෙනු ඇත.

**ඈ) කොන්දේසි :**

01. තෝරා ගන්නා අයදුම්කරුවන් පුහුණු කාල සීමාව තුළ කොළඹ හෝ කඳන හෙද විදුහල් වල නීති හා රෙගුලාසි වලට බැඳී සිටිය යුතුය.
02. තෙවසරක පුහුණු කාලය සාර්ථක ලෙස නිමාකළ පසු A ශ්‍රේණියේ ස්ථිර මාණ්ඩලික හෙදියන් ලෙස ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍ය ශාලාවට අනුයුක්ත කරනු ලැබේ. ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ ස්ථිර සේවයට අනුයුක්ත කරනු ලබන හෙද නිලධාරීන්ට වෙනත් රෝහල් වලට ස්ථානමාරු නොමැත.
03. තෝරාගනු ලබන අයදුම්කරුවන් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායක විය යුතුය.
04. තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ජයවර්ධනපුර මහරෝග්‍යශාලාව සමග තෙවසරක පුහුණු කාල සීමාව සාර්ථකව නිම කරලීමට හා අවම වශයෙන් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍ය ශාලාවේ වසර දහයක (10) කාලයක් සේවය කිරීමට එකඟතාවය දක්වමින් ගිවිසුමකට හා බැඳුම්කරයකට එළැඹිය යුතුය.
05. තෝරා ගන්නා අයදුම්කරුවන් පුහුණුව ආරම්භ කිරීමට පෙර ඉහත ගිවිසුම්පත හා බැඳුම්කරය ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල් මණ්ඩලය වෙත භාර දිය යුතුයි.
06. ඉහත අංක 4 සහ ප්‍රකාර ගිවිසුම්පතෙහි කොන්දේසි කඩ කරනු ලැබුවේ නම් අභ්‍යාසලාභියා විසින් රුපියල් ලක්ෂ තුනක (රු. 300,000/-) ඇපකරය සහ අභ්‍යාසලාභියා වෙනුවෙන් රෝහල් මණ්ඩලය දැරූ සියලු වියදම් ශ්‍රී ජයවර්ධනපුර රෝහල් මණ්ඩලය වෙත ගෙවිය යුතු වන්නේය.
07. පුහුණුව ලබන කාලය තුළ විනය කඩකිරීමක් හෝ ශාරීරික හා මානසික යෝග්‍යතා නොවන බව තහවුරු වුවහොත් පුහුණුව අත්හිටුවීමට සිදුවනු ඇත.
08. ඉල්ලා ඇති නියමිත සුදුසුකම් නොමැති බව හෝ වංචනික තොරතුරු ඉදිරිපත් කර ඇති බව තහවුරු වුවහොත් පුහුණුව අත්හිටුවීමට සිදුවේ.

**අයදුම්කරන පිළිවෙල**

ඉහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන් 2023.06.02 දිනට පෙර අධ්‍යක්ෂ, ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල, තලපත්පිටිය, නුගේගොඩ යන ලිපිනයට අයදුම්පත් යොමු කළ යුතුය. කවරයේ වම් ඉහළ කෙළවරේ "**ශිෂ්‍ය හෙදියන් සඳහා අයදුම්පත**" යනුවෙන් සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ,**
**ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල,**
**තලපත්පිටිය, නුගේගොඩ.**